දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவா ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )
Date ) 31 .01.2022

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதாரம் அமைச்சு
**Ministry of Health**

---

**චක්‍ර ලේඛ අංක :** ~~02-09-2022~~ 01-06/2022

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ආයතන ප්‍රධානි,
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

## 'ලෝක පිළිකා දිනය' – 2022 පෙබරවාරි 04

වර්තමාන ගෝලීය පිළිකා උවදුර බරපතල මට්ටමක පවතින අතර එය ඉදිරි වසර කීපයේදී ඉහළ යාමට නියමිතය.වසර 2020 දී ලොව පුරා නව පිළිකා රෝගීන් මිලියන 19.3ක් අළුතින් හදුනා ගන්නා ලදී. මෙම කාලය තුල ලොව මිලියන 10ක් පිළිකා නිසා මිය ගිය බව අනුමාන කරනලදී. මීලඟ වසර විස්ස තුලදී ලොව පිළිකා රෝගීන් ගණන මිලියන 28.5 දක්වා ඉහල යනු ඇතැයි අපේක්ෂිතය. පිළිකා සත්කාරයේ අඩු ලුහුඬුකම් නැති කිරීම මෙන් ම පිළිකා පිලිබද දැනුම්වත් වීම වැඩි කිරීම සඳහාත් පිළිකාවේ වර්තමාන තත්ත්වය පිලිබද ක්‍රමෝපායන් වැඩි දියුණු කිරීම සඳහාත් ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම සිදු කල යුතු වේ.

ජාතික පිළිකා මර්දන වැඩසටහන මඟින් ප්‍රකාශයට පත් කරන පිළිකා ආවේක්ෂණ දත්ත වාර්ථාවට අනුව ශ්‍රී ලංකාව තුල 2019 වසරේ නව පිළිකා රෝගීන් 31,848 ක් හඳුනා ගැනුණි. මෙය පිළිවෙලින් ජනගහනය 100,000 කට දල අනුපාතිකය 146 ක් ද, වයස ප්‍රාමාණිකෘත අනුපාතය (Age Standardized Incidence Rate) 128.9 ක්ද වේ.

පිළිකා රෝගය හේතුවෙන් සෑම පුද්ගලයෙක්ම දුප්පත් පොහොසත් භේදයකින් තොරව කුමන අයුරකින් හෝ පීඩාවට පත් විය හැක. එමෙන්ම පිළිකා රෝගය හේතුවෙන් පුද්ගල මට්ටමෙන්, පවුල් මට්ටමෙන් හා ප්‍රජා මට්ටමෙන් ඇති විය හැකි අහිතකර ප්‍රථිපල අවම කිරීම සඳහා කටයුතු කිරීමේ හැකියාවක් සියලු දෙනාම සතුව ඇත.

සෑම වසරකම පෙබරවාරි 04 වන දිනය ලෝක පිළිකා දිනය ලෙස නම් කර සියලු දෙනා තුලම පිළිකා පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමට පියවර ගෙන ඇත. එහි අරමුණ වන්නේ වලක්වා ගත හැකි පිළිකා හේතුවෙන් මියයන මිලියන ගණනක් ජීවිත සුරැකීමට රාජ්‍ය මට්ටමෙන් මෙන්ම පුද්ගල මට්ටමෙන්ද ක්‍රියාත්මක වී පිළිකා සත්කාරයේ අඩු ලුහුඬුකම් අවම කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ද ඇතුළුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වේ. 2022 වසර සඳහා ලෝක පිළිකා දිනයේ තේමාව වන්නේ **"ගැටළු හඳුනා ගනිමු; සත්කාරයේ හිඩැස පුරවමු" ("Close the care gap; Realising the problem")** යන්නයි.
ඒ බැවින්, මෙම වසරේ ලෝක පිළිකා දිනය සැමරීමේ මූලික අරමුණ වන්නේ පිළිකා සත්කාරයේ අඩු ලුහුඬුකම් හඳුනා ගෙන අදාළ පරිදි ඒ සඳහා නිසි පියවර ගැනීමයි.

මෙම වසරේ තේමාව ක්‍රියාවට නැංවීම සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහන සියලුම සෞඛ්‍ය සේවා ආයතන (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, රෝහල්, යනාදී) වලට නිර්දේශ කරනුයේ පහත සඳහන් ක්‍රියාකාරකම් ආයතන හා දිස්ත්‍රික් මට්ටමින් 2022 පෙබරවාරි මාසය තුල පවත්වන ලෙසයි.

1. ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් පිළිකා සත්කාරයේ අඩු ලුහුඬුකම් හඳුනා ගැනීම සඳහා පවත්වනු ලබන සමීක්ෂණය සඳහා සහභාගී වීම. මෙම සමීක්ෂණ පෝරමය ක්ෂේත්‍ර නිලධාරීන් හරහා එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයකින් පිළිකා රෝගීන් 5 දෙනෙකුට ලබා දී සම්පූර්ණ කර එවීම සිදු කල යුතු ය.
2. පිළිකා මර්දනය හා වලක්වා ගැනීම සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
3. පිළිකා මර්දනය හා වලක්වා ගැනීම සඳහා ප්‍රජාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

දිස්ත්‍රික්ක මට්ටමින් සිදු කරන ඉහත සඳහන් ක්‍රියාකාරකම් වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග, වෛද්‍ය නිලධාරී - මාතෘ හා ළමා සෞඛ්‍ය හා ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් සම්බන්ධීකරණය සිදු කිරීම අපේක්ෂා කරනු ලැබේ. මෙහි දී සිදු කරන දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩසටහන් සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහන මඟින් ප්‍රකාශයට පත් කර ඇති සැනපත් කට්ටල, පුහුණුකරුවන් පුහුණු කිරීමේ අත්පොත වැනි සෞඛ්‍ය අධ්‍යාපන මෙවලම් භාවිතා කල හැකි වේ.

මෙම වැඩසටහන් නිසි පරිදි නිම කිරීමෙන් අනතුරුව පෙබරවාරි මස අවසානයේ ලෝක පිළිකා දිනය සැමරීම සඳහා විශේෂයෙන් සිදු කරන ලද කාර්යයන් ඇතුලත් සංක්ෂිප්ත වාර්තාවක් හා සම්පූර්ණ කරන ලද සමීක්ෂණ පෝරම අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වමි.
තවද, 2022 ලෝක පිළිකා දිනය සැමරීම සඳහා සිදු කරන වැඩ සටහන්වලදී ඔබගේ සක්‍රිය දායකත්වය හා මඟ පෙන්වීම අපේක්ෂා කරන අතර එය ඉතා අගය කොට සලකමි. මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු ඔබ ආයතනයේ අදාල සියලු කාර්ය මණ්ඩල වල දැන ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසද දන්වමි.

මේ පිළිබඳව වැඩි දුර විස්තර සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහනේ අධ්‍යක්ෂවරිය දුරකථන අංක: 0112368627 හෝ ඊමේල් nccpmohsl@gmail.com හරහා අමතන්න.

වෛද්‍ය. අසේල ගුණවර්ධන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.

පිටපත්:
1. ගරු අමාත්‍ය, සෞඛ්‍ය අමාත්‍යංශය
2. ගරු රාජ්‍ය අමාත්‍යවරුන්, සෞඛ්‍ය අමාත්‍යාංශය
3. ගරු පළාත් සෞඛ්‍ය අමාත්‍යවරුන්
4. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
5. පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
6. අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) - සෞඛ්‍ය අමාත්‍යාංශය
7. අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) - සෞඛ්‍ය අමාත්‍යාංශය
8. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - වෛද්‍ය සේවා I හා II, ප්‍රාථමික සෞඛ්‍ය සේවා I හා II, සැලසුම්, අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ, දන්ත සෞඛ්‍ය සේවා හා රසායනාගාර සේවා - සෞඛ්‍ය අමාත්‍යාංශය
9. අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්දන වැඩසටහන 7
10. අධ්‍යක්ෂ - පවුල් සෞඛ්‍ය කාර්යාංශය
11. අධ්‍යක්ෂ - බෝ නොවන රෝග ඒකකය
12. අධ්‍යක්ෂ - සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
13. අධ්‍යක්ෂ - ප්‍රාථමික සෞඛ්‍ය සේවා
14. අධ්‍යක්ෂ - පෞද්ගලික සෞඛ්‍ය අංශ ප්‍රවර්ධන
15. අධ්‍යක්ෂ - ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය
16. අධ්‍යක්ෂ - වතු හා නාගරික සෞඛ්‍ය